රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:08/2005

මගේ අංකය:- ආ7/3/1/31
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2005 මාර්තු මස 31 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම-දේපළ ණය</u>**

දේපල ණය ලබාදීම සඳහා 2005 අයවැය මඟින් යෝජිත වැඩපිළිවෙල අනුව පහත දැක්වෙන විධිවිධාන 2005.01.01 දින සිට ක්‍රියාත්මක කරනු ඇත.

ඒ අනුව රජයේ නිලධාරීන්ට නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලට ගැනීම / නිවාස දේපලක් මිලට ගැනීම / නිවසක් ඉදිකිරීම / නිවසක වැඩ නිම කිරීම / ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් දේපලක් මිලට ගැනීම යන කරුණු සඳහා ණය ලබාදීමට අදාළ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තියේ විධිවිධාන වෙනුවට පහත දැක්වෙන විධිවිධාන 2005.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදේශ කරනු ලැබේ.

11. <u>බැංකු මඟින් දේපල ණය ලබාදීම</u>

11.1. <u>ණය ලබාදිය හැකි කාර්යන්</u>

11:1:1 නිවසක් ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් මිලට ගැනීමට

11:1:2 ණය ඉල්ලුම්කරුට අයත් ඉඩමක අළුතින් නිවසක් ඉදිකිරීමට

11:1:3 නිවසක් සහිත ඉඩමක් / මහල් නිවාසයක් මිලට ගැනීමට

11:1:4 ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට සහ අලුතින් කොටසක් එකතු කිරීමට

11:1:5 අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට

11:2 <u>සුදුසුකම්</u>

11:2:1 රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වීම

11:2:2 විශ්‍රාම වැටුප්/දායක විශ්‍රාම වැටුප් හිමි වර්ෂ 05 ක සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති නිලධාරියකු වීම

11:2:3 ස්වාමි පුරුෂයා හා භාර්යාව යන දෙදෙනා ම රජයේ නිලධාරීන් නම් දෙදෙනා ම වෙන් වෙන්ව ණය ලබා ගැනීමට සුදුස්සන් වීම. එසේ වුවද එකම දේපලක් සඳහා දෙදෙනාට ම ණය ලබාගැනීමේ අයිතිය නොමැත.

11:2:4 රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කිරීම සඳහා තාවකාලිකව මුදාහැර සිටින ඉහත 11:2:1 හා 11:2:2 යටතේ සුදුසුකම් ලබන නිලධාරීන්

11:2:5 මෙම ක්‍රමය යටතේ ණය ලබාගත හැක්කේ සේවා කාලය තුළ එක් වරක් පමණි.

11:3 <u>ණය අයකර ගැනීමේ කාල සීමාව</u>

උපරිම කාලය වර්ෂ **25** ක් හෝ නිලධාරියාට වයස අවුරුදු **60** සම්පූර්ණ වීම හෝ යන දෙකින් පලමුව එළඹෙන කාලය තුළ සම්පූර්ණ ණය මුදල පියවා ගත හැකි අයුරින් ආපසු අයකර ගැනීමේ කාලසීමාව තීරණය කළ යුතුය.

11:4 <u>ණය ප්‍රමාණය</u>

11:4:1 නිලධාරියාට හිමිකම් ලබාගත හැකි උපරිම ණය මුදල නිලධාරියාගේ දීමනා හැර වසර **05** ක ඒකාබද්ධ වැටුප හෝ රුපියල් දස ලක්ෂයක මුදල යන දෙකෙන් අඩු මුදල වේ.

11:4:2 රජයේ වගකීමකින් තොරව යම්කිසි නිලධාරියකුට ඉහත 11:4:1 සීමාවට අමතරව ණය ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම් බැංකුවේ සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව ණය ලබාගැනීමට බැංකුව සමඟ ගිවිස ගත හැක.

11:5 <u>පොලිය</u>

11:5:1 ඉහත 11:4:1 වගන්තිය යටතේ ලබා ගන්නා ණය මුදල් වෙනුවෙන් නිලධාරියාගෙන් 4% ක වාර්ෂික පොලියක් අය කරනු ලැබේ.

11:5:2 ඉහත 11:4:1 වගන්තිය යටතේ ලබා ගන්නා ණය සඳහා බැංකු පොලී අනුපාතිකය සහ නිලධාරියාගෙන් අයකරන 4% ක පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් දරනු ඇත.

11:5:3 පොලිය ගණනය කරනු ලබන්නේ හීන වන ණය ශේෂය පදනම් කර ගනිමිනි.

11:5:4 නිලධාරීන්ගෙන් අයකර ගනු ලබන ණය වාරිකය හා ඉහත **11:5:3** ගණනය කරන ලද 4% ක පොලිය ඇතුලත් මාසික වාරිකය මුළු ණය මුදල ගෙවා අවසන් වන තෙක් සමාන වාරික ලෙස අයකළ යුතුය.

11:6 <u>ඇප</u>

ඉහත 11:1 හි කාර්යන් වෙනුවෙන් ණය අයදුම් කරන දේපල බැංකුව වෙත උගස් කළ යුතුය.

11:7 <u>ණය වාරික අය කිරීම හා ප්‍රේෂණය කිරීම</u>

11:7:1 නිලධාරියා සේවය කරන ආයතනය විසින් බැංකුවේ නිර්දේශිත ණය වාරික මුදල, නිලධාරියාගේ වැටුපෙන් අඩු කරනු ලබන 4% ක පොලිය හා රජය විසින් දරන පොලිය අදාල බැංකුව වෙත මාසිකව ප්‍රේෂණය කළ යුතුය.

11:7:2 නිලධාරියා වෙනුවෙන් රජය විසින් දරනු ලබන පොලී ප්‍රමාණය රජයේ වියදමක් ලෙස භාණ්ඩාගාරයේ උපදෙස් මත ගිණුම් තැබිය යුතුය.

11:8 <u>හිඟ ණය වාරික</u>

11:8.1 යම්කිසි සේවා ගැටළුවක් හේතුවෙන් නිලධාරියාට වැටුප් නොගෙවන අවස්ථාවකදී ණය වාරික අය නොකිරීම පිළිබඳව අදාල බැංකුව වෙත ආයතන ප්‍රධානීන් විසින් නොපමාව දැනුම් දිය යුතුය.

11:8:2 සේවය අතහැර යාමකදී හෝ සේවයෙන් පහ කිරීමකදී ණය ශේෂය සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නිතිරීති අනුගමනය කළ යුතුය.

11:8:3 සේවය අතහැර යාම, සේවයෙන් පහ කිරීම හා වැඩ තහනම් කිරීමකදී හෝ සේවයෙන් විශ්‍රාම යාමේදී ණය වාරික අදාළ ණය ඉල්ලුම්කරු විසින් බැංකුවේ නීති හා රෙගුලාසි වලට අනුකූලව රජය විසින් දරණ පොලියේ වෙනස ද ඇතුළුව පෞද්ගලිකව අදල බැංකුව වෙත ගෙවිය යුතුය.

11:8:4 සේවය තහනම් කළ නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවූවහොත් වැඩ තහනම් කරන ලද කාලය තුළ නිලධාරියා විසින් ගෙවන ලද ණය වාරිකවලට අදාළව රජය විසින් දරණ පොලිය පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

11:8:4:1 නිලධාරියාගේ වරදක් නොමැති බව දක්වමින් ඔහු නැවත සේවයේ පිහිටවූවහොත් ඔහු විසින් ගෙවන ලද ණය වාරික වල ඇතුලත් රජය විසින් දරනු ලබන පොලිය සම්පූර්ණයෙන් ඔහු වෙත ප්‍රතිපූරණය කළ යුතුවේ.

11:8:4:2 නිලධාරියා නැවත සේවයේ පිහිටුවන ලද්දේ යම් කිසි දඬුවමකට යටත්ව නම් දඬුවමේ ස්වභාවය නොසලකා ගෙවන ලද වාරිකවල ඇතුලත් රජය විසින් දරන පොලි ප්‍රමාණයෙන් අඩක් පමණක් ප්‍රතිපූර්ණය කළ යුතුවේ.

11:8:5 අනිවාර්ය නිවාඩු ගත්වා ඇති නිලධාරියෙකු සම්බන්ධව ණය වාරික හා පොලිය සාමාන්‍ය පරිදි බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර රජය විසින් පොලියේ වෙනස දරනු ලැබේ.

11:8:6 යම්කිසි නිලධාරියකු අර්ධ වැටුප් ගෙවන අවස්ථාවකදී ණය වාරික හා පොලිය අය කිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

11:8:6:1 එසේ වුවත් නිලධාරිණියක ප්‍රසූති නිවාඩු මත අර්ධ වැටුප් ලබන අවස්ථාවකදී ණය වාරිකය හා පොලිය පෞද්ගලිකව බැංකුව වෙත ගෙවිය යුතු අතර පොලියේ වෙනස රජය විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ.

11:8:7 නිලධාරියෙකු වැටුප් රහිත නිවාඩු ලබාගැනීමේදී ණය වාරික හා පොලිය අය කිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

11:8:8 සේවා කාලය තුලදී නිලධාරියෙකු මිය ගියේ නම් හෝ පූර්ණ අකර්මණ්‍යතාවට පත්වූයේ නම් හෝ එදිනට ණය ශේෂය ණය ඇපකර අරමුදල මගින් මාසිකව බැංකුව වෙත නිරවුල් කිරීමට රජය විසින් කටයුතු කරනු ලැබේ.

11:8:9 රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහැර සිටින ඉහත 11:2:4 අනුව සුදුසුකම් ලබන නිලධාරියෙකුගේ ණය වාරික හා 4% ක පොලිය නිලධාරියා සේවය කරන ආයතනය මගින් බැංකුව වෙත ප්‍රේෂණය කළයුතු අතර, එම කාලසීමාව සඳහා පොලී වෙනස අදාළ නිලධාරියා ද්විතීයනය යටතේ පත්වීම ලැබූ ආයතනය විසින් ප්‍රේෂණය කරනු ලැබේ.

11:8:9:1 රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා ස්ථිරව මුදාහරින නිලධාරියෙකුගේ ණය වාරික හා පොලිය අයකිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය කොන්දේසි අනුගමනය කළ යුතුය.

11:8:10 යම්කිසි හේතුවක් නිසා නිලධාරියා සියදිවි හානිකර ගෙන ඇත්නම් අදාල ණය මුදල් අයකර ගැනීම සම්බන්ධව බැංකුවේ නීති රීති අනුගමනය කළ යුතුය.

11:9 <u>ණය ඉල්ලුම්පත් පෙරසැරි කිරීමේ ගාස්තු</u>

නිර්දේශිත බැංකුවකින් ණය ලබාගැනීමට යාමේදී ඉදිරිපත් කළයුතු ලියවිලි වන තක්සේරු වාර්තාව, නීතිඥ ගාස්තු, ගමන් වියදම් ද ඇතුළුව අවම මුදල රු.7500/- ක් හෝ උපරිමය ණය මුදලින් 1% ක් විය යුතුය.

11:9:1 ණය සඳහා වන ඉල්ලුම් පත්‍රය බැංකුව වෙත ඉදිරිපත් කිරීමේදී ඉහත 11:9 වගන්තියේ සඳහන් අවම මුදල අදාල බැංකු ශාඛාවේ තැන්පත් කළ යුතුය.

11:9:2 ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් පත්ඉරු ලබාගැනීම, හිමිකම් වාර්තාව ලබාගැනීම, මැණුම් සැලසුම් ගාස්තු, ඇටර්නි බලය ලියාපදිංචි කිරීමේ ගාස්තු හා හිමිකම් ඔප්පුවල දෝෂ ඇත්නම් ඒවා රක්ෂණය කිරීම සඳහා යන වියදම් (ඉහත 11:9:1 වගන්තියේ සඳහන් මුදලට අමතරව) නිලධාරියා විසින් පෞද්ගලිකව දැරිය යුතුය.

11:10 <u>දේපල ණය දීමේ සාමාන්‍ය කොන්දේසි</u>

11:10:1 රජය විසින් දරනු ලබන පොලිය මත නිලධාරියාට ලබාදිය යුතු ණය මුදල නිර්දේශ කිරීමේදී අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

ණය මුදල නිර්දේශ කිරීමේදී නොසැලකිලිමත්කම හේතුවෙන් ඇතිවන ගැටළුවලදී සහ රජයට සිදුවන අලාභයන්හිදී ණය මුදල නිර්දේශ කළ නිලධාරියාට විරුද්ධව කටයුතු කිරීමට පියවර ගන්නා අතර, අලාභය එම නිලධාරියාගෙන් අය කරනු ඇත.

11:10:1:1 මෙම ණය මුදල නිලධාරියාගේ වැටුපෙන් අවකරණය කළ හැකි උපරිම සීමාව වූ 40% සීමාවෙන් නිදහස් වේ.

11:10:1:2 නිලධාරියාගේ වැටුපෙන් අවකරණය කරන ලද බැඳීම්ගත අඩුකිරීම් හා වෙනත් අඩුකිරීම් සැලකිල්ලට ගෙන 11:10:1:1 වගන්තියට යටත්ව බැංකුව වෙත උපරිම ණය මුදල නිර්දේශ කළ යුතුය.

11:10:2 යම්කිසි නිලධරයකු ණය ලබාගත් සේවා ස්ථානයෙන් ස්ථාන මාරුවීමක් ලබා ඇත්නම් ඒ බව අදාල අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් ණය ලබාගත් බැංකුව වෙත දැනුම් දිය යුතු අතර, ස්ථාන මාරුවීම් ලැබූ ස්ථානය වෙත 25 පරිශිෂ්ටයට අනුකූලව අදාල තොරතුරු ලබාදිය යුතුවේ. මාරුවීම් හේතුකොට ගෙන ණය වාරික අඩුකිරීම් මග නොහැරීමටත් බැංකුවලට කරනු ලබන ප්‍රේෂණයන් ප්‍රමාද නොකිරීමටත් ආයතන ප්‍රධානියා විසින් වග බලාගත යුතුය.

11:10:3 ණය ලබාදීමට බැංකුව වෙත නිර්දේශ කරන ලද නිලධාරියෙකු එම ණය මුදල ලබා ගැනීමට පෙර වැඩ තහනමකට ලක්වුවහොත් හෝ සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ අනිවාර්ය නිවාඩු යවනු ලැබුවහොත් හෝ එවැනි තත්වයන් ණය මුදල බැංකුවෙන් ලබා ගැනීමට පෙර බැංකුව වෙත නොපමාව වාර්තා කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.

11:10:4 ණය ලබාගැනීමට සුදුසුකම් ලත් නිලධාරියෙකුට දෙපාර්තමේන්තුවකින් හෝ අමාත්‍යාංශයකින් හෝ බැංකුව වෙත කරනු ලබන නිර්දේශය ප්‍රමාද වන්නේ නම් හෝ බැංකුවකින් ණය ලබාගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන්නේ නම් හෝ ඒ බව ලිඛිතව භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්විය යුතුය.

11:11 <u>ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම හා නිර්දේශ කිරීමේ ක්‍රියාදමය</u>

1:11:1 ණය ඉල්ලුම්කරුවෙකු විසින් 26 පරිශිෂ්ටය අනුව අයදුම්පත්‍ර පිටපත් 3 කින් පිළියෙල කර දෙපාර්තමේන්තු ප්‍රධානයා මගින් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

11:11:2 අමාත්‍යාංශය විසින් අදළ ණය ඉල්ලුම් පත්‍රය පොරොත්තු ලේඛණයට ඇතුලත් කර 11:10:1 වගන්තිය අනුව ලබාදිය හැකි ණය මුදල තීරණය කොට ණය ඉල්ලුම්කරුගේ කැමැත්ත පරිදි අදළ බැංකුව වෙත සතියක් ඇතුලත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

11:11:3 ණය ඉල්ලුම්කරු විසින් අදල ණය මුදල ලබාගැනීම සඳහා එම බැංකුවේ නීතිරීතිවලට එකගව හා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව අවශ්‍ය තොරතුරු මාස තුනක් සම්පූර්ණ වීමට පෙර බැංකුව වෙත සපයා ණය මුදල අනුමත කිරීමෙන් අනතුරුව බැංකුව මගින් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය.

11:11:4 බැංකුව විසින් ණය මුදල නිදහස් කිරීමෙන් පසු ඒ බව 27 පරිශිෂ්ටය අනුව භාණ්ඩාගාරයට හා අදළ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතුය.

11:11:5 අමාත්‍යාංශය විසින් බැංකුවක් වෙත නිර්දේශ කරන ලද ණය ඉල්ලීමක් මාස තුනක් ඇතුලත දී ලබා ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු බැංකුව වෙත ලබා නොදෙන අවස්ථාවකදී බැංකුව විසින් එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. කිසිදු හේතුවකින් මෙම කාලය දිර්ඝ කිරීමක් සිදු නොකරනු ලබන අතර එවැනි ඉල්ලීම් ද නව ඉල්ලීමක් ලෙස පොරොත්තු ලේඛණයට ඇතුලත් කරනු ලැබේ.

11:11:6 28 පරිශිෂ්ටය අනුව ලේඛනගත කර ඇති බැංකුවලින් පමණක් ණය ලබාගත හැක.

**02.** ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ **11** වගන්තියේ විධිවිධාන හා එම විධිවිධාන සංශෝධනය කරමින් **2004.12.31** දින දක්වා නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි විධිවිධාන අනුව දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි ඉහත ආයතන සංග්‍රහයේ සංශෝධන ආදේශ කරනු ලැබේ.

**03.** **2004.12.31** දින වන විට අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර ඇති දේපල ණය වලින් නිවාස ඉදිකිරීම් සඳහා කර ඇති ඉල්ලීම්වලට සහ **2005** වර්ෂයේදී කරනු ලබන ඉල්ලීම්වලින් නිවාස ඉදිකිරීම් සඳහා වූ ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් පමණක් මෙම චක්‍රලේඛය අනුව **2005** වසරේදී කටයුතු කළ යුතුය.

ඩී. දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

## 25 පරිශිෂ්ටය

## නිලධාරියෙකු ස්ථාන මාරුවී යාමේදී ණය වාරික ප්‍රේෂණය කිරීම පිළිබඳව ස්ථාන මාරුවී යන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම (11:10:2 වගන්තිය)

මගේ අංකය:-
.........................................අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව

........................................................... මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කළ ...................................................... (තනතුර) ........................................................................ මහතා/මහත්මිය/මෙනවිය .................................... දින සිට ...................................................... අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීම් ලබා ඇත.

ඔහු/ඇය විසින් .................................................. බැංකුවේ .................................................. ශාඛාවෙන් ලබාගෙන ඇති රු. ................................. වන ණය මුදල පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. නිලධාරියාගේ නම :-

   ණය හිමිකම් අංකය:-

   බැංකුවේ යොමු අංකය

   දැනට ගෙවා ඇති වාරික ප්‍රමාණය:-

   ඉදිරියට ගෙවිය යුතු වාරික ප්‍රමාණය:-

   අවසාන වාරිකය ගෙවනු ලැබුවේ කවර මාසය වෙනුවෙන්ද:-

   චෙක්පත් විස්තරය:

   චෙක්පත් අංකය :-
   බැංකුව හා ශාඛාව:-
   චෙක්පත් අංකය :-

2. ණය වාරිකය :- රු XXX

   ඒ සඳහා පොලිය (4%) :- රු. XXX

   රජය දරණ පොලී වෙනස :- රු. XXX

   ප්‍රේෂණය කළ මුළු මුදල :- රු. XXX

අමාත්‍යාංශය ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානයා
(නිල මුද්‍රාව )

දිනය:-

පිටපත: 1. කළමනාකරු .................................... බැංකුව
.................................... ශාඛාව

2. ........................................................................ (නිලධාරියා වෙත)

## 26 පරිශිෂ්ටය

### ණය ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළයුතු අයදුම් පත්‍රය
### (11:11:1 වගන්තිය)

**.................................................. සඳහා ණය ඉල්ලුම් පත්‍රය**

1. නිලධාරියාගේ සම්පූර්ණ නම :-
2. ස්ථිර තනතුර ( දැනට සිටින පන්තිය / ශ්‍රේණිය ):-
3. හැඳුනුම්පත් අංකය:-
4. ස්ථිර ලිපිනය :-
   1. පෞද්ගලික :-
   2. රාජකාරි :-
5. දුරකථන අංකය:-
   1. පෞද්ගලික :-
   2. රාජකාරි :-
6. 11:1 වගන්තිය යටතේ ණය ඉල්ලුම්කරන කාරණය:-
7. ඉල්ලුම් කරනු ලබන ණය මුදල :-
8. ඇමුණුම 4 අනුව ණය මුදල ලබාගැනීමට අපේක්ෂිත බැංකුව හා බැංකු ශාඛාව:-

ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 11 වගන්තියේ ණය මුදලට අදාළ විධිවිධාන හා රට අනුකූල පරිදි බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නීති රෙගුලාසිවලට අනුව ණය ලබාගැනීමට එකඟ වෙමි.

දිනය:-

............................
ණය ඉල්ලුම්කරු

---

...................................... (අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ) ආයතන ශාඛාව විසින් සම්පූර්ණ කළ යුතුය.

1. මුල් පත්වීමේ දිනය :-
2. උපන් දිනය :- ණය ඉල්ලුම්කරන දිනට වයස:-
3. (අ) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පත්වීමක්ද?

   (ආ) එසේ නම් කවර දිනක සිටද?
4. දැනට රජයෙන් ලබාගෙන ඇති ණය පිළිබඳ විස්තර

| ණය වර්ගය | ............. දිනට ගෙවිය යුතු ණය ශේෂය |
|---|---|
| | |

5. මාසික වැටුප් විස්තරය:-

I. මාසික ඒකාබද්ධ වැටුප :- ........................................................ XXX
II. දීමනා :- .................................................................................. XXX
III. මුළු වැටුප :- ............................................................................ XXX
IV. මුළු අඩුකිරීම් (බැඳීම්ගත අඩුකිරීම් සහිතව):-.............................. (XXX)
V. ශුද්ධ වැටුප :- .......................................................................... XXX
(අදාළ මාසයේ වැටුප් විස්තරය අමුණා ඇත)
VI. ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 11:4:1 වගන්තියේ විධිවිධාන අනුව නිලධාරියාට ලබාදිය හැකි උපරිම ණය මුදල:-

(ඉලක්කමෙන් .....................................)
(අකුරෙන් ............................................)

6. නිලධාරියාට විරුද්ධව නොවිසඳුන විෂමාචාර චෝදනාවක් හෝ දැනට විභාග වෙමින් පවතින විෂමාචාර චෝදනා තිබේ නම් ඒ පිළිබඳ විස්තර:-

දිනය:-

මාණ්ඩලික නිලධාරියා
( ආයතන )

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:-**

මගේ අංකය:-
.........................................................(අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව)

.........................................................පදිංචි .........................................
මහතාට/මහත්මියට/මෙනවියට ඔහුගේ/ඇයගේ ඉල්ලීම පරිදි ..........................................
(කාර්යය) සඳහා මාසික වැටුපෙන් අයකර ගත හැකි මුදල, හිමි උපරිම ණය මුදල හා බැංකුවේ නිර්දේශ අනුව ණය මුදලක් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි.

අත්සන:-

නම :-

තනතුර:-

නිල මුද්‍රාව:-

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය:-**

මගේ අංකය:-
අමාත්‍යාංශය:-

කළමණාකරු:-
..................................බැංකුව
................................. ශාඛාව

රජය විසින් ලබාදෙන පොළී සහනාධාර මත ........................................................................ මහතාට/මහත්මියට/මෙනවියට ඉහත දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට යටත්ව බැංකුව විසින් නිර්දේශ කරන දේපල ණය මුදල ලබාදීම අනුමත කරමි.

එසේම ඔහුගේ වැටුපෙන් බැංකුවේ නිර්දේශ අනුව බැංකුව විසින් ගණනය කරනු ලබන ණය වාරිකය හා 4% පොලිය ද සහිත නිලධාරියාගෙන් අය කළ යුතු මාසික ණය වාරිකය හා එම මාසික ණය වාරිකයට ඇතුලත් වන රජය විසින් දරණු ලබන පොලී ප්‍රමාණයද ණය වාරිකය සමග 11:7:1 වගන්තිය යටතේ මාසිකව බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට එකඟ වෙමි.

අත්සන:-

නම :-

තනතුර:-

(නිල මුද්‍රාව )

**27 පරිශිෂ්ටය**
**බැංකුව විසින් ණය මුදල නිදහස් කල බව අදල**
**අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට දන්විය යුතු ආකාරය**
**(11:11:4 වගන්තිය)**

.....................................(අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා)

...............................................(අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව)

**<u>............................................................ගේ ණය මුදල නිදහස් කිරීම</u>**

1. බැංකුව හා බැංකු ශාඛාවේ නම:-

2. ණය හිමිකම් අංකය :-

3. ණය ලාභියාගේ සම්පූර්ණ නම :-

4. ලිපිනය : පෞද්ගලික :-

   රාජකාරි :-

5. අනුමත කරන ලද ණය මුදල :- රු. ........................................... (ඉලක්කමෙන්)
   රු. ............................................. (අකුරෙන් )

6. ණය මුදල අනුමත කළ දිනය :-

7. ණය අයකරනු ලබන කාලසීමාව :-
   වර්ෂය 2005 .................................. සිට 200 .............................. දක්වා

8. මාසික ණය වාරිකය :-
   8.1 4% පොලිය සමග වාරිකයේ වටිනකම:- රු.
   8.2 ගෙවිය යුතු මුළු වාරික ගණන :-

දිනය:-.....................

............................................
කළමණාකරු
කළමණාකරුගේ නම:
නිල මුද්‍රාව :

පිටපත්:-
1. අධ්‍යක්ෂ ජනරාල්
   ජාතික අයවැය දෙපාර්තමේන්තුව
   මහා භාණ්ඩාගාරය
   කොළඹ 01.

2. ...................................................... අමාත්‍යාංශය

**28 පරිශිෂ්ටය**

**ණය ලබාගත හැකි බැංකු නාම ලේඛනය**
**(11:11:6 වගන්තිය)**

1. මහජන බැංකුව
2. ලංකා බැංකුව
3. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
4. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
5. කොමර්ෂල් බැංකුව
6. එන්.ඩී.බී. නිවාස සමාගම
7. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව